## 4.2 - ජන ගී ගායනා ඉදිරිපත් කරමු.

නිපුණතා මට්ටම 4.2 :නියමිත තිත් රූප හා නාද මාලා අනුගමනය කරමින් ගායන ඉදිරිපත් කරයි.

ආදරණීය දුවේ පුතේ,

ඔබට ජන ගායනා විවිධ අවස්ථාවලදී අසන්නට ගයන්නට ඉගෙන ගැනීමට අවස්ථාව ලැබෙන්නට ඇති.නිවැරදි නාද මාලා අනුගමනය කරමින් ඒ ඒ ගායනයන්ට ආවේණික නාදමාලා අනුව ඔබ ගායනා පුරුදු වන්නට ඇති.ඔබට ලැබෙන ප්‍රායෝගික අභ්‍යාස යටතේ 09 ශ්‍රේණියට අදාලව පහත ආකාරයට අපි ඉගෙන ගනිමු.

හොඳයි දරුවනේ,

පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

1. ජන ගායනා යනු කෙටියෙන් හඳුන්වන්න.
2. ඔබ දන්නා ජන ගායනා කිහිපයක් නම් කරන්න.
3. ජන ගායනා වල සුවිශේෂතා 5 ක් ලියන්න.

<u>කඩතුරා කවි</u>

උඩරට,පහතරට හා සබරගමු යන සම්ප්‍රදායන් තුනටම පොදු ගායනා විශේෂයක් ලෙස හැඳින්විය හැක.කඩතුරාව යනු ශාන්තිකර්ම වලදී සුදු පිරුවටයක් ලෙස රංග සැරසිල්ල ආවරණයට භාවිත කරන තාවකාලික ආවරණයයි.මෙම කවි බෞද්ධාගමික මුහුණු වරක් ගනී.

| | |
|---|---|
| සිහින් සිනිඳු සළුව පැළඳ විත් උන් | මරඟන |
| වහන්ස නුඹ අප අතහැර මන්ද මහණ | උණ |
| අහංකාර ඒ මරඟන දැක්කා බුදු | ගුණ |
| මිහින්තලා ධාතු බෙලෙන් කඩතිර | හරිමිණ |

| | |
|---|---|
| ඈත එපිට දීපංකර මුණි විවරණ | ගන්නේ |
| මෑත කපේදී මතු බුදු වෙමැයි සිතා | ගන්නේ |
| බූත පියස් යක්ෂ රෝග බය දුක් දුරු | වන්නේ |
| ජේතවනාරාම බෙලෙන් කඩතිර හරි | මින්නේ |

## <u>ගොයම් කවි</u>

කෘෂිකාර්මික ජන සමාජය තුළ මිනිසා වී ගොවිතැන තම වෘත්තිය ලෙස තෝරාගෙන ඇත.මෙම ගොවීන් තමන්ගේ කාන්සිය මාන්සිය දුරු කර ගැනීම සඳහා ගොයම් කවි ගායනා කල අතර මෙම කවි ජීවන වෘත්තීන් හා බැඳි ගායනා වේ.

රන් දෑ කැති ගෙන නිති සැරසෙනවා
රත්රන් පටි ඉණ වට දිළිසෙනවා
රිවිඳුටු පිණි බිඳු ලෙස පාවෙනවා
දුම්බර කෙතේ අපි ගොයම් කපනවා

ඉරු දෙවියන්ගේ ඉර ගල ගාවා
සඳ දෙවියන්ගේ සඳ ගල ගාවා
ගණ දෙවියන්ගේ කෝවිල ගාවා
අපිත් කියමු කවි ගොවිපල ගාවා

උදේ සිටන් වකුටු කොන්ද දිග හැරපල්ලා
අතේ තියෙන ගොයම් මිටිය බිම දමපල්ලා
හිසේ තියෙන ලේන්සු පොඩිය අතට ගනිල්ලා
සතර වරම් දෙවි පිහිටෙන් ගොඩට වරෙල්ලා

## <u>පන් නෙළීමේ කවි</u>

පන් කර්මාන්තය හා සබැඳි ගායනා විශේෂයකි.ගැමි ජනතාවගේ වෘත්තියක් ලෙස මෙහිදී ඔවුන්ගේ සාමූහිකත්වය,එකමුතු කම,සුහද තාවය පිළිබඳ කියැවේ.මෙම කවි ඉතා සරල නාද මාලාවකින් යුක්ත වේ.

ගාන තෙල් සඳුන් වරලස ඔමරි කොට
මූණ පුරා තෙල් ගාගෙන යන කලට
මාන බලති මිණුවන් පන් තියෙන කොට
නැනො නුඹත් එනවද පන් නෙළන්නට

කොනින් කොණට පන් උදුරා ගන්නේ
තැනින් තැනට පන් අහුරු දමන්නේ
අනුන්ගේ පන්කොළ එක් නොකරන්නේ
බැණුම් අහන්නට වෙයි දැන ගන්නේ

නිවැරදි නාදමාලා අනුව ගායනා කිරීමට ඔබ මෙම කවි පාඩම් කරන්න.එමෙන්ම කිහිප වරක් අසා නිවැරදි නාද මාලාව අනුගමනය කරන්න.

<u>ඇගයීම</u>

1. නිවැරදි නාදමාලා අනුව කවි ගායනා කරන්න.
2. ගැමි ගායනා වල සුවිශේෂතා මොනවාද?
3. ජන ගායනා හා සබැඳි සංස්කෘතික පසුබිම දක්වන්න.

සැකසුම :-එම්.කේ.සී දිල්රුක්ෂි ,ර/නිවි/ලෝකදෙණිය විද්‍යාලය,
උඩ කරවිට.